# තායිලන්තය (සියම) හා ශ්‍රී ලංකාව අතර පැවති සංස්කෘතික සබඳතා පිළිබඳ ඓතිහාසික විමසුමක්

කලුන්දෑවේ චන්දවිමල හිමි

## හැඳින්වීම

තායිලන්තය හා ශ්‍රී ලංකාව ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය මත ගොඩනැගුණු රාජ්‍යයන් දෙකක් වන අතර එනිසා ම එම රාජ්‍යයන් දෙක අතර ගොඩනැගුණු සබඳතාවන්ට සංස්කෘතික ක්ෂේත්‍රයේදී සුවිශේෂිත බවක් හිමි වී තිබේ. සංස්කෘතික සබඳතාවන්ට අමතරව මානව කණ්ඩායම්හි හුවමාරුව මත ද දෙරටේ සබඳතා වඩාත් ශක්ති මත් වී තිබේ. දෙරටේ සබඳතාවන්හි වස්තු බීජය ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය මත ගොඩනැගී ඇති බැවින් එම සබඳතාවන්හි ඉතිහාසය ද ඈත අවධියට ගමන් කරයි. සියම හා ශ්‍රී ලංකාව අතර ගොඩගැගෙන සංස්කෘතික හා මානව හුවමාරුවීම් නිසා දෙරටේ ම ඒ ඒ ක්ෂේත්‍රයන්හි කැපී පෙනෙන සංවර්ධනයක් මෙන් ම ස්ථාවර බවක් ද ඇති වී තිබේ. එම ස්ථාවර බව තත් රාජ්‍යයන්හි ඉතිහාසයේ විවිධ අංශ ශක්තිමත් කිරීම ට ද සමත්ව ඇත. ඒ අනුව මෙම ලිපිය තුළින් දෙරට අතර ගොඩනැගුණු සංස්කෘතික සබඳතාවන්හි ඉතිහාසය, එම සබඳතාවන්හි ස්වරූපය හා දෙරට අතර හුවමාරු වූ මානව කණ්ඩායම් හා සංස්කෘතිකාංග කවරේද යන්න අධ්‍යයනය කෙරේ.

### ❖ දෙරට අතර පැවති සංස්කෘතික සබඳතා හා ඒවායේ ඓතිහාසික පසුබිම

සියමත් ශ්‍රී ලංකාවත් අතර ගොඩනැගුණු සබඳතාවේ ඉතිහාසය ක්‍රි. ව. හත්වන සියවස තරම් ඈත අවධියකට ගමන් කරන බව ඇතැම් ඉතිහාසඥයන්ගේ අදහස වී තිබේ. ක්‍රි. ව. හත්වන සියවසේ සිට ක්‍රි. ව. එකොළොස්වන සියවස පමණ තෙක් තායිලන්තයේ පැවතියේ යැයි අනුමාන කරන ද්වාරවතී රාජ්‍යයේ මධ්‍යම සියමෙන් හා ඊශානදිග සියමෙන් හමු වූ ලෝකඩ බුදුපිළිම එයට නිදසුන් ලෙස

ඔවුහු පෙන්වා දෙති. එම බුදුපිළිම අනුරාධපුර යුගයේ ඒ අවධියේ බුදුපිළිමවල දක්නට ලැබෙන අභය මුද්‍රාව, සිවුරු පාරුපනය, කර්කටක මුද්‍රාව යන ලක්ෂණවලින් යුක්ත වෙයි.[1] එම පිළිම දකුණු ඉන්දියාවේ අමරාවතී හා ශ්‍රී ලංකාවේ අනුරාධපුරයත් ආශ්‍රිතව දියුණු වූ සම්ප්‍රදායේ ආභාසය මත නිමවන්නට ඇතැයි යනුවෙන් ද ඔවුහු අදහස් කරති.[2] ක්‍රි. ව. දහසයවන සිවසට පමණ අයත් වේයැයි සැල කෙන තායි වංසකථාවක් වන **ජිනකාලමාලියේ** එන විස්තරයකට අනුව ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර සබඳතා ආරම්භ වනුයේ ක්‍රි. ව. දහතුන්වන සියවසේ දී පමණ සිටය.[3] එහි එන විස්තරයට අනුව මේ සම්බන්ධයට මුල් වූයේ 'සීහලපටිමා හෙවත් සිහිංගවර පටිමා' නම් ආශ්චර්යමත් පිළිමයක් පදනම් කරගෙනය. එය අයත්ව තිබුණේ සිංහල රජවරුන්ටය. මෙම කරුණ ඒ ආකාරයෙන් ම පිළිගැනීමට ඉතිහාසඥයෝ මැලි වෙන අතර **ජිනකාලමාලියේ** එන මෙම කරුණු විශ්වසනීයත්වයෙන් තොර බව ද පෙන්වා දෙති.[4] කෙසේ නමුදු මෙම විස්තරයන්ට අනුව අනුරාධපුර රාජධානියේ මධ්‍ය කාලයේ සිට ම තායිලන්තය; ශ්‍රී ලංකාව සමඟ සබඳතා ගොඩ නගාගත් බවත් ශ්‍රී ලංකාවේ සංස්කෘතික ආභාසය තත් අවධියේ සිට ම තායිලන්තයට ලැබී ඇති බවත් මෙයින් පැහැදිලි වෙයි. මෙම පිළිම ඉන්දියාවේ අමරාවති හෝ ගුප්ත සම්ප්‍රදාය හෝ සිංහල සම්ප්‍රදාය නියෝජනය කරන බව Reginald Le May (රෙජිනල්ඩ් ලි මෙ) ද පෙන්වා දෙයි.[5] සුඛෝතායිහි ඇති නිර්මාණ සඳහා සිංහල දේශයේ බලපෑම හොඳින් ලැබී ඇති බව ඔහු විසින් තර්කානුකූලව පෙන්වා දී තිබේ.

අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ ඉතා හොඳින් ජනප්‍රියව පැවති ශ්‍රී මහා බෝධි වන්දනාව, ශ්‍රී පාද ලාංඡනය වැනි වන්දනා ක්‍රම මෙන්ම ත්‍රිපිටක හා අටුවා වැනි ධර්ම ග්‍රන්ථ ද ක්‍රි. ව. හත්වන සියවස තරම් කාලයකදී ද්වාරවතී රාජ්‍යයේ ජනප්‍රියව පැවති බව පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් තහවුරු වෙයි. වර්තමාන තායිලන්තයේ අගනුවර වන බැංකොක් නුවරට කි. මී. 150ක් පමණ දුරින් පිහිටි 'ප්‍රාචීන්බූරි' නමැති ස්ථානයේ ශ්‍රී ලංකාවෙන් ගෙන ගිය ශ්‍රී මහා බෝධි අංකුරයකින් වැඩුණු විශාල බෝරුකක් ඇත. එය නැගෙනහිර තායිලන්තයේ බෞද්ධ සංස්කෘතියේ විශේෂ කේන්ද්‍රීය සංකේතයක් ලෙස සැළකේ. එම බෝධින් වහන්සේ පිහිටි ප්‍රදේශය ''ඩොන්සීමාබෝ'' (ශ්‍රී මහා



බෝධි අඩවිය) යන නමින් හැඳින්වේ.[6] මේ විස්තරයෙන් පැහැදිලි වනුයේ සියමේ ද්වාරවතී ශිෂ්ටාචාරය පැවති අවධියේ ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද ගණනාවක් තායිලන්තය ලබාගෙන ඇති බවය. මෙරට වන්දනීයත්වයට පාත්‍ර වූ පූජනීය වස්තු තායිලන්තය තුළ ද එකසේ ජනප්‍රිය වීමෙන් පැහැදිලි වනුයේ මෙරට සමඟ සමීප වශයෙන් සංස්කෘතික සබඳතා ගොඩනගාගෙන ඇති බවය. එසේ සමීප සබඳතා පැවැත්වීමට ප්‍රධාන හේතුව වනුයේ දෙරට ම ථේරවාදී සම්ප්‍රදාය ගරු කරන රාජ්‍යයන් දෙකක් වශයෙන් පැවතීම යැයි විශ්වාස කළ හැකිය.

මෙම ආගමික සබඳතාවන්ට අමතරව භාෂාමය දැනුම හා මෙරට ජනප්‍රිය කථා පුවත් ද්වාරවතී රාජ්‍යය තුළ ප්‍රසිද්ධව පැවති බව අභිලේඛන මූලාශ්‍රවලින් පැහැදිලි වෙයි. ශකවර්ෂ 683 හෙවත් ක්‍රි. ව. 761 පිහිටුවන ලද පුවරු ලිපියක ශ්‍රී ලංකාවේ රචිත **තේලකටාහ ගාථා** නම් පාළි කාව්‍යයේ ත්‍රිවිධ රත්නයට කරන ලද නමස්කාර ගාථා තුන අන්තර්ගතවූ තිබේ. මෙම තේලකටාහ ගාථා කැලණියේ කැලණිතිස්ස රජතුමාගේ කාලයේ සිදු වූ පුවතක් වන අතර එම සිදු වීම පාදක කරගෙන මෙරට තේලකටාහ ගාථා නමින් පාළි කාව්‍යයක් ලියවුණි.[7] එහි එන මේ නමස්කාර ගාථා තායිලන්තයේ ප්‍රාචීන්බූරි ස්ථානයේ තිබුණු සෙල්ලිපියකින් හමුවීම තුළින් පෙන්නුම් කරනුයේ අනුරාධපුරයේ සිට තායිලන්තයට වැඩම කළ මෙරට භික්ෂූන් වහන්සේලා පිරිසක් විසින් තත් ග්‍රන්ථය ද රැගෙන යන්නට ඇති බවය. එසේම ශ්‍රී ලංකාවෙන්-වැඩිය භික්ෂූන් වහන්සේලා මේ ස්ථානයේ වාසය කරන්නට ඇති බවට ද මෙයින් විශ්වාස කළ හැකිය. මෙම සෙල්ලිපියේ 'වර පාද ප්‍රතිෂ්ඨා' යන සඳහනක් ද අන්තර්ගතව පවතී. ඒ අනුව ඒ ස්ථානයේ කරන ලද කැණීමකදී පාද ලාංඡන දෙකක් සොයාගෙන තිබේ. ඒවා ආවරණය කර බිත්ති බැඳ තිබූ අතර එහි චෛතියඝරයක් තිබෙන්නට ඇතැයි තායි පුරාවිද්‍යාඥයෝ කල්පනා කරති.[8] මෙවැනිම ශ්‍රී පාද ලාංඡන පිහිටුවීමක් හා ඒ වටා චෛතියඝර පිහිටුවීමක් අනුරාධපුර ථූපාරාමයට නැගෙනහිර ප්‍රදේශයෙන් සොයාගෙන තිබේ. ප්‍රාචීන්බූරි පාද ලාංඡන පිහිටුවීම අනුරාධපුර පාද ලාංඡන පිහිටුවීමේ අනුකරණයෙන් පිහිටුවන්නට ඇතැයි ඇතැම් තායි පුරාවිද්‍යාඥයෝ විශ්වාස කරති.[9] මෙම විස්තරයන්ට අනුව යටත් පිරිසෙන් ක්‍රි. ව. හත්වන සිය

වසේ සිට ක්‍රි. ව. එකොළොස්වන සියවස දක්වාවත් තායිලන්තයේ ද්වාරවතී ශිෂ්ටාචාරය සමඟ අනුරාධපුර ශිෂ්ටාචාරය සමීප සංස්කෘතික සබඳතා පවත්වන්නට ඇති බව මෙයින් පැහැදිලි වෙයි.

පොළොන්නරුව අවධියේදී ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර සංස්කෘතික සබඳතා පැවති බවට නිදසුන් හමුවේ. පොළොන්නරුවේ ඉදි වූ කලා නිර්මාණ අතර නිශ්ශංකමල්ල රජතුමාගේ අවධියේ ඉදි වූ සත්මහල් ප්‍රාසාදය මීට පෙර ශ්‍රී ලංකාවේ දී දක්නට නොලැබුණු නිර්මාණයකි. එම නිර්මාණයට ආභාසය වන්නට ඇත්තේ සියමේ 'ලම් පූන්' නගරයේ ''වත් කුකුත්'' (කුක්කුටාරාමය) නමැති විහාරස්ථානය වන්නට ඇතැයි යන්න ඇතැමුන්ගේ අදහස වී තිබේ. මීට සමාන ගොඩනැගිලි තායිලන්තයේ ඇතුළු අග්නිදිග ආසියාතු රටවල් කීපයකම අදටත් දැකිය හැකිය.[10] මේ අවධියේදී සියමත් ශ්‍රී ලංකාවත් අතර වාස්තු විද්‍යාත්මක සබඳතා ගොඩ නැඟෙන්නට ඇතැයි මෙයින් කල්පනා කළ හැකිය.

ශ්‍රී ලංකාව හා තායිලන්තය අතර ගොඩනැගුණු සංස්කෘතික සබඳතාවල වැදගත් අවස්ථාවක් 'සිරිධම්ම' නගරය හා කේන්ද්‍ර කර ගෙන පවතී. දකුණු තායිලන්තයේ ශ්‍රී ධර්මරාජ අගනුවර හා සම්බන්ධ ඉතිහාසය අනාවරණය කරන **රත්නවාලුකා වංසයට** අනුව සිරිධම්ම නගරය පිහිටා තිබුණේ හේමමාලා හා දන්තකුමරු ශ්‍රී ලංකාවට යද්දි කලක් නතර වී සිටි තැනය. (මෙම සිදුවීම් ඇතැම් විටෙක අතිශයෝක්තියෙන් යුක්ත වෙයි.) මෙම නගරය මලය අර්ධද්වීපයේ කුඩා ගොඩ බිම් තීරුවේ පිහිටා තිබේ. මෙහි ඇති වූ සාගත අවස්ථාවකදී රජතුමා හා ජනතාව නගරය හැර දමා නැගෙනහිර ප්‍රදේශයට යන විට වැලි තලාවකට පැමිණියහ. එහි අලුත් නගරයක් නිර්මාණය කිරීමට බමුණන් හතර දෙනෙකු සැලැස්මක් හදා දුන්හ. එහිදී රජු එම නගර සැලැස්මට අනුමැතිය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවට දූතයන් පිරිසක් එවා තිබේ. සිංහල රජු අතිශයින් සතුටුව එම සැලැස්ම අනුමත කොට නව නගරයේ ආගමික කටයුතු කිරීම සඳහා 'ධම්මගම්භීර' නමැති සිංහල මහ තෙරවරයකු සමඟ එම දූත පිරිස එහි යවා ඇත. නගරය ගොඩනැගීමේ දී එහි පාලකයා සිංහල භික්ෂුවගෙන් අවවාද අනුශාසනා ලබාගෙන තිබේ. මෙම සිදුවීමේ කිසියම් සත්‍යයක් තිබිය හැකිය. එය සත්‍යයක් නම් තායිලන්තයේ ආගමික කටයුතු කිරීම



සඳහා මෙන්ම ගෘහ නිර්මාණ ශිල්පයටත් නගර නිර්මාණයටත් ශ්‍රී ලංකාවෙන් ආභාසය ලැබී ඇති බව තීරණය කළ හැකිය. ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර ප්‍රථම වරට ඍජු සබඳතා ඇති වනුයේ සිරිධම්ම නගරය කේන්ද්‍ර කරගෙන බව පසුකාලීනව ලියවී තිබෙන වංසකථාවලින් හෙළි වෙයි.

ක්‍රි. ව. 1260 ගණන්වලදී ශ්‍රී ලංකාවත් තායිලන්තයත් අතර සබඳතා ගොඩනැගෙන්නේ බුද්ධ ප්‍රතිමාවක් මූලික කරගෙනය. සිරිධම්ම නගරයට වැඩම කළ අසිරිමත් බුදුපිළිමයක් පිළිබඳව **සිහිංගවර බුද්ධ නිදානය** හෙවත් (උතුම් සිංහල බුදුපිළිමයේ නිදාන කථාව) මෙන්ම **ජිනකාලමාලි** ග්‍රන්ථයේ ද සඳහන් වෙයි.[11] මෙහි සඳහන්වන තොරතුරුවලට අනුව සියමේ සුඛෝදයේ රජු (සුඛෝදයේ ආරම්භක ඉන්ද්‍රාදිත්‍ය රජු හෝ ඔහුගේ මුනුබුරු 'රාම් කම්හෙං' රජු විය හැකිය) සිරිධම්ම නගරයේ රජු සමඟ කතිකා කරගෙන ශ්‍රී ලංකාවේ ඇතැයි කියන අසිරිමත් බුදුපිළිමය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට දූතයන් එවා තිබේ. මේ අසිරිමත් බුදුපිළිමය බු. ව. 700දී එනම් ක්‍රි. ව. 158 දී පමණ රජවරුන් තිදෙනෙකු පාලනය කරද්දී එක් කෙනෙකු රහතන් වහන්සේලාගේ අනුශාසනා මත නිර්මාණය කළ ලෝකඩ පිළිමයකැයි විශ්වාස කෙරේ. මෙය ශ්‍රී ලංකාවේදී මහත් පුදපූජාවන්ට ලක්ව ඇති අතර එය ලබා ගැනීමු සඳහා ක්‍රි. ව. 1256 දී ඉහත දූත පිරිස ශ්‍රී ලංකාවට පැමිණි බව සඳහන් වේ. එම පිළිම වහන්සේ සියමට වැඩම කරවීමේ කථා පුවත ආශ්චර්යමත් සිදුවීම්වලින් ගහණය. **ජිනකාලමාලියේ** එම කථා පුවත අතිශයෝක්තියෙන් සඳහන් කර ඇති අතර එහි එන විස්තරයට අනුව පැහැදිලි වනුයේ 'රෝච' රජු එය සිරිධම්ම නුවර සිට සුඛෝදයට වඩමවාගෙන ගිය බව ය.[12] එම බුදුපිළිමය සුඛෝදයට වැඩම කර වීමෙන් පසුව වසර 700ක් පමණ සියම් රජවරුන්ගේ රාජ්‍ය බලයේ සංකේතයක් ලෙස සම්මානයට පාත්‍ර විය.[13] මෙරට පාලකයෙකු සතුව දළදා වහන්සේ පවතී නම් ඔහු මෙරට රාජ්‍යයට උරුමකම් කියන බව මෙරට පාලකයන් හා සාමාන්‍ය ජනයා තුළ විශ්වාසයක් තිබූ[14] අතර එම විශ්වාසය ඒ ආකාරයෙන් ම සියම තුළ ද ජනප්‍රිය වූ බව මෙයින් පැහැදිලි වෙයි. මෙරට රජවරුන් දළදා වහන්සේ තමන් සන්තක කර ගැනීම සඳහා යම්සේ ගැටුම්වලට[15] මැදිහත් වූයේ ද ඒ ආකාරයෙන් ම සිංහල බුදුපිළිමය ලබා ගැනීම

සඳහා සියම් පාලකයන් අතර වරින්වර අර්බුද හා ගැටුම් ඇති වී තිබේ.[16] මෙම විශ්වාසයන් සමකාලීන සමාජ සංස්ථා දෙකේදී ම දක්නට ලැබීමෙන් පැහැදිලි වන කරුණ වනුයේ දෙරට අතර සිදු වූ සංස්කෘතික මුසුවීම්වල ස්වභාවය කවරේද යන්නයි. එම ස්වර්ණාලේපිත බුදුපිළිමය වර්තමානයේ බැංකොක් නුවර කෞතුකාගාරයේ ''සිහිංග බුද්ධ ශාලා'' නමැති සුවිශේෂිත කුටියක තැන්පත් කර තිබේ.[17] එම බුද්ධ ප්‍රතිමාව සෑම වසරකම අප්‍රේල් මාසයේ දාහත රවනදා එයින් එළියට වඩමවා පෙරහැරින් නුවර ප්‍රදක්ෂිණා කොට කෞතුකාගාරය ඉදිරිපස ඇති 'සනාම්ලුවාන්' නමැති පිට්ටනියේ කූඨාගාරයක තැන්පත් කෙරේ. තායි බෞද්ධ ජනතාව එයට වන්දනාමාන කරන අතර එයින් පසුව නැවතත් කෞතුකාගාරයේ තැන්පත් කරයි. ඒ වෙනුවෙන් විශේෂ පූජා චාරිත්‍ර සමුදායක් පවතී.[18] මෙම පූජා චාරිත්‍රය ශ්‍රී ලංකාවේ පවත්නා දළදා වහන්සේ වෙනුවෙන් කරනු ලබන පූජා චාරිත්‍රයන්ට සමානකමක් දරයි.[19] සිංහල බුද්ධ ප්‍රතිමාව සම්බන්ධයෙන් ගොඩනැඟී තිබෙන චාරිත්‍ර විධි සියල්ල ම පාහේ දළදා වහන්සේ වෙනුවෙන් මෙරට පැවති චාරිත්‍ර ක්‍රමවේද, විශ්වාස යන් හා සමාන වන හෙයින් මෙරටින් තත් ආභාසය සියම් වැසියන් ලබා ගන්නට ඇතැයි කල්පනා කළ හැකිය.

මෙම කථා පුවත් හා සැසඳෙන විස්තර **මහාංවසෙයේ** හා **පූජාවලියේ** සඳහන්ව තිබේ. දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රජ සමයේ (ක්‍රි. ව. 1236 - 1271) 'තම්බලිංග' දේශයෙන් හෙවත් තමලිංග මුවෙන් පැමිණි චන්ද්‍රභානු නම් ජාවක රජකු දෙවරක් ම ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ බව සඳහන් වෙයි.[20] ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ මේ චන්ද්‍රභානු රජු **සිහිංගවර බුද්ධ නිදානයේ** ද **ජිනකාලමාලියේ** ද සඳහන්වන සුඛෝදයේ රජු හා සිරිධම්ම රජු අසිරිමත් පිළිමය ලබා ගනු සඳහා ශ්‍රී ලංකාවට එවූ දූතයා විය හැකි බව බොහෝ ඉතිහාසඥයන්ගේ අදහස වී තිබේ. එම දූතයාට නම් දෙවන පරාක්‍රමබාහු රජතුමා බුදුපිළිමය පරිත්‍යාග කළ බවක් මූලාශ්‍රවල සඳහන් වන්නේ නැත. නමුත් තත් අවධියේ 'තමලිංගමුවේ ධම්මකිත්ති' නම් මහතෙර නමක් පිඬු පිණිස වඩනා කල්හි පෙරමඟ පියුම් පැන නැංගේයැයි අසා දෙවන පරාක්‍රමබාහු රජතුමා දහම් පඬුරු හා රජ පඬුරු යවා උන්වහන්සේ මෙහි වැඩමවා උන්වහන්සේ යටතේ පළාබත්ගල සුවිශේෂී වූ වනවාසී භික්ෂු පුහුණු මධ්‍යස්ථානයක් පිහිටු වූ බව **මහාවංසයේ** හා **පූජාවලියේ** සඳහන් වෙයි.[21] මෙම කථා සිද්ධියට අනුව මෙරටින් අසිරිමත් බුදුපිළිමයත්, එරටින් ධම්මකිත්ති හිමියනුත් දෙපිරිස හුවමාරු කරගන්නට ඇතැයි කල්පනා කළ හැකිය. අසිරිමත් බුදු පිළිමය සුඛෝදයට වැඩමෙවූ 'රාම්කම්හෙං' රජු සුඛෝදය රාජ්‍යය තායිලන්තයේ ප්‍රබල බෞද්ධ රාජ්‍යය බවට පත් කළේය. එතුමා විසින් එම නගරයේ පිහිටුවන ලද සෙල්ලිපියකට අනුව ශ්‍රී ලංකාවෙන් වැඩම කළ සිංහල මහාසාමි සංඝරාජ කෙනෙකු එතුමාගේ අනුග්‍රහයෙන් සියමේ සුඛෝදය ප්‍රදේශයේ සිංහල බුදු සමය පැතිර වීය.[22] මෙම උපසම්පදා විනය කර්මයත් සමඟ ස්ථිර වශයෙන් ම සියමේ සිංහල සංඝ ශාසනයේ පිහිටීම සිදු විය. සියම තුළ සිංහල සංඝ ශාසනය පිහිට වූ ආකාරය පිළිබඳ දිගු විස්තරයක් **ජිනකාලමාලියේ** සඳහන් වෙයි.[23] එම ක්‍රියාවලිය තුළින් සියමේ සිංහල සංඝ ශාසනය නමින් නව භික්ෂු නිකායක් ඇති විය. මෙවැනි අතිශයින් සමීප වූ සංස්කෘතික සබඳතාවක් දඹදෙණිය අවධියේ දී තායිලන්තයත් ශ්‍රී ලංකාවත් අතර තිබුණු බව ඉහත තොරතුරුවලින් ගම්‍ය වෙයි.

ක්‍රි. ව. දාහතරවන සියවසේ සුඛෝදය රාජ්‍යයේ පාලකයා වූ 'ලූ තායි' රජුගේ කාලයේදී (ක්‍රි. ව. 1317 - 1347) ශ්‍රී ලංකාව හා සියම අතර ආගමික සම්බන්ධතා වර්ධනය විය. මේ රජු සමන්තකූටයේ ශ්‍රී පාදය අනුකරණය කරමින් තම රාජ්‍යයේද බුද්ධපාද රාශියක් කළ බවට තොරතුරු හමුවේ.[24] ඔහුගේ රාජ්‍ය කාලයේ තායි රජ පවුලට අයත් කුමාරයෙක් පැවිදි වී ඉන්දියාවෙන් මෙන් ම ශ්‍රී ලංකාවෙන්ද ධාතුන් වහන්සේලා රැසක් රැගෙන සියමට වැඩිය බව වාර්තා වේ.[25] සුඛෝදයේ ඇති 'වත්මහතත්' විහාරය ශ්‍රී ලංකාවේ සංස්කෘතික ආභාසය පෙන්නුම් කෙරෙන කැඩපතක් වැනිය. රෙජිනෝල්ඩ්ගේ අදහසක් උපුටා දක්වන ඉලංගසිංහයන් පෙන්වා දෙනුයේ සිංහල බුදුදහම තායි ජනතාවගේ ආගම කෙරෙහි ඇති කළ බලපෑමේ උපත පිළිබඳව මේ සුඛෝතායි නිර්මාණ අගනා නිදසුන් බවය.[26] ''මෙය නියම කොට ඇති ආකාරයේ අභ්‍යන්තර හැඟීම් නිසැකයෙන් ම තායි වුවත්, ක්‍රි. ව. පස්වන සියවසට අයත් සීගිරි අප්සරාවගේ හා පරිවාර ස්ත්‍රියකගේ රූපද සමඟ සංසන්දනය කළ විට ඊට වඩා මෑත දී එම දිවයිනේ පොළොන්නරුවේ ඇති, දෙළොස්වන සියවසට අයත් රූපද සමඟ

සංසන්දනය කළ විට මෙයට ප්‍රබෝධය දුන් බලවේගය පැමිණියේ ශ්‍රී ලංකාවෙන් බව පැහැදිලි වේ.[27] මේ ආකාරයෙන් සුඛෝතායි නගරයේ 'ශ්‍රී චුම්' විහාරය ගැන රෙජිනෝල්ඩ් පඬිවරයා විසින් කර තිබෙන විග්‍රහය අතිශයින්ම වැදගත් වෙයි. 'ශ්‍රී චුම්' විහාර මන්දිරය ඉදි කිරීමේදී ද එයට අවශ්‍ය කරන පදනම ශ්‍රී ලංකාවෙන් ලැබුණු බව ඔහු විසින් දක්වා ඇති කරුණුවලින් පැහැදිලි වෙයි. ඔහු විසින් ඉදිරිපත් කරන. ''සුකෝතායි සම්ප්‍රදායට පදනම වියෙංසෙන් ක්‍රමය ලෙස පිළිගත්තත්, තවත් බලවේග ක්‍රියාත්මක වූ බව පැහැදිලි බැවින්, මේවායේ ප්‍රභවය ලංකාවට සම්බන්ධ කළ හැකි බවට සැකයක් නැත. එබැවින් නියම සුකෝතායි ක්‍රමය වියෙංසෙන් හා ලක්දිව ක්‍රමවල සම්මිශ්‍රණයක් වේ.''[28] ඉහත සඳහන් ප්‍රකාශය ද සියමට ශ්‍රී ලංකාවෙන් ලැබුණු දායාදයන්ගේ තත්ත්වය කෙබඳුද යන්න අවබෝධ කර ගැනීමට ප්‍රමාණවත්ය 'රාම් කාම්හෙං' රජු කළ බවට සලකනු ලබන සියමේ 'සංඝටාකාර දාගැබ' සහ ඇත් පවුර සහිත 'වාම් ලෝම් විහාරය' සිංහල ශෛලියට එහි ඇති සබඳතාව පැහැදිලිව දක්වයි.[29] මෙවැනි නිර්මාණ රැසක් තායිලන්තය තුළ ශේෂව ඇති අතර කාම්බෝජයේ 'ඛමේර්' රාජ්‍යයෙන් පසුව සිංහල රටේ ආභාසය තායිලන්තයට ලැබුණු ආකාරය එහි ඇති නිර්මාණ ම සාක්ෂි සපයයි.

### ❖ භික්ෂු කණ්ඩායම් අතර පැවති සබඳතා හා සංස්කෘතික දායාද

සියම් රටේ හා ශ්‍රී ලංකාවේ භික්ෂූන් වහන්සේලා අතර ඍජු සමීප සබඳතා අතීතයේ සිට ම ගොඩනැගී තිබුණු බවට සාධක මෙරට හා තායිලන්තයේ ශේෂ වී ඇති මූලාශ්‍රයන්හි අන්තර්ගත වී තිබේ. එම සබඳතා සියල්ල ම පාහේ වර්ධනය වී තිබෙනුයේ ථෙරවාදී බුදුදහම හා බැඳී පවතින චාරිත්‍ර වාරිත්‍ර හා අධ්‍යාපනික පසුබිම තුළය. ගම්පොළ අවධියේදී ද දෙරට අතර ආගමික සබඳතා දියුණු මට්ටමක පැවති බවට තොරතුරු හමු වේ. සුඛෝදයේ රජ පවුලට සමීප සබඳතා තිබෙන භික්ෂුවක් මෙම අවධියේ ගම්පොළ රාජධානියට වැඩම කොට වසර දහයක් පමණ මෙහි වාසය කරමින්, මහියංගනය ආදි විහාරස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු කරමින් අනුරාධපුර හා පොළොන්නරු සිද්ධස්ථාන වැඳ පුදාගෙන නැවත සියමට ගොස් ශ්‍රී



ලංකාවේ තමන් ගත කළ ජීවිතය පිළිබඳ තොරතුරු ඇතුළත් කොට දීර්ඝ සෙල්ලිපියක් පිහිටුවා තිබේ.[30] එහි එන විස්තරයකට අනුව උන් වහන්සේට දළදා වහන්සේ සිය දෝතට වඩමවා ගැනීමේ අවස්ථාවක් හිමි වී තිබේ. උන්වහන්සේගේ කාලයේ සුඛෝදයේ රජු වූ 'ශ්‍රී ධර්ම රාජ ලිදය්ය' නම් රජු (ක්‍රි. ව. 1347 - 1361) ලක්දිව සුමනකූට පර්වත මුදුනේ ඇති සිරිපතුලේ ඡායා සටහනක් පිටපත් කරගෙන එන ලෙස දූත පිරිසක් ලක්දිවට එවා තිබේ. එසේ පිටපත් කරගෙන ගිය සිරිපා සටහන සුඛෝදය නගරයට බටහිර කන්දේ පිහිටුවා එම ස්ථානය 'වත් සුමන කූට විහාරය' යනුවෙන් නම් කරන ලදී.[31] ශ්‍රී ලංකාවේ සුමනකූට පර්වත මුදුනේ ඇති සිරිපාද ලාංඡනය සේම සලකා මේ ස්ථානයට වන්දනා මාන කරන ලෙස ජනතාවට උපදෙස් දී තිබේ. එම සිරිත හා වන්දනාමාන චාරිත්‍රයන් අදද එම ස්ථානයේදී සිදු වේ. පැහැදිලි ලෙස ම මෙම සිදුවීම ශ්‍රී ලංකාව තුළ වූ පූජා චාරිත්‍ර ධර්මයන්ගේ ආභාසය තායි ජනතාවට ලැබුණු අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. මෙම සංස්කෘතික හුවමාරුව හැමවිටකම පාහේ ආගමික මුහුණුවරක් මත ගොඩනැගී ඇති බව දක්නට පුළුවන.

මේ අවධියේ සියමේ සිට මෙරටට පැමිණි බොහෝ වන්දනාකරුවන්ගේ ජනප්‍රිය වූ ස්ථානයක් වූයේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වන්දනා කිරීමය. එසේ පැමිණි වන්දනාකරුවන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අංකුර කිහිපයක් ම එහි රැගෙන ගොස් රෝපණය කර තිබේ. එසේ රෝපණය කළ බෝධීන් වහන්සේලා දෙනමක් තායිලන්තයේ චියාං මායි, හා ප්‍රාචීන්බුරි වැනි ස්ථානවල අදද දක්නට ලැබේ. **ජිනකාලමාලියේ** සඳහන් වෙන ආකාරයට එම බෝධීන් වහන්සේ රෝපණය කර ඇත්තේ 'මහාබෝධාරාමය' විහාරය පිහිටි ස්ථානයේදී ය.[32] තායි වන්දනා කරුවන්ට අමතරව බුරුම වන්දනා කරුවුන් ශ්‍රී මහා බෝධියෙන් බෝ ඇට ගෙනවිත් බුරුමයේ රෝපණය කිරීමේ වැඩ පිළිවෙලක් ද ගෙන ගිය බව **ජිනකාලමාලියේ** සඳහන් වෙයි.[33] 'ලිදය්ය' රජුගේ කාලයේ ශ්‍රී ලංකාවෙන් සියමට වැඩිය වන වාසී මහාසාමී සංඝරාජ කෙනෙකු ගැන තායි වංසකථා කිහිපයක ම සඳහන් වෙයි. එම මහාසාමී සංඝරාජයන් වහන්සේ එරට රාජමාතාව විසින් කරවා දුන් ප්‍රාසාදයක වැඩ වාසය කරමින් එරට සිංහල ශාසන ක්‍රමය ව්‍යාප්ත කරලීමේ නියලී සිටි අතර උන්වහන්සේ විසින් **ලෝක**

ජ්පදීපක සාරය නමින් ග්‍රන්ථයක් ද එහිදී රචනාකර තිබේ.[34] උන්වහන්සේ පිළිබඳ කීර්තිය සමස්ත සියම පුරාම පාහේ ව්‍යාප්ත වී තිබුණි. සුඛෝදයේ සිටි 'සුමන හා අනෝමදස්සි' නම් භික්ෂූන් දෙනමක් මුත්තිම නගරයට ගොස් උන්වහන්සේ වෙතින් පැවිදි උපසම්පදාව ලබා වසර පහක් උන්වහන්සේ වෙත වාසය කොට සුඛෝදයට නැවත ගොස් එහි හා එම නගරයට උතුර දිශාවෙන් පිහිටි 'ශ්‍රී සජ්ජනාලයෙහිද' සිංහල වනවාසී සම්ප්‍රදාය ව්‍යාප්ත කරන්නට යෙදුණාහ.[35] මෙම සංඝරාජයන් පිළිබඳ කීර්තිය උතුරු ප්‍රදේශයේ 'වියාං මායි' නගරයට ද පැතිර ගියේය. මේ අතර එහි පාලක 'කිලනා' රජු සිංහල උපසම්පදාව ලබාදෙන ලෙස ඉල්ලා බුරුමයේ මුත්තිම නගරයට දූත පිරිසක් යැවීය.[36] එවිට ඒ හිමියන් තම ශිෂ්‍ය සුමන ස්ථවිරයන් එහි යැවීය. උන්වහන්සේ 'වියංමායිහි' සිංහල ශාසන ක්‍රමය පතුරුවා එම නගරයට ආසන්න 'ලම්පුන්හි' ද 'වජිරප්‍රාකාර' පුරයේ ද වනවාසී සිංහල ශාසන සම්ප්‍රදාය ව්‍යාප්ත කළේය.[37] මෙම කරුණුවලින් සිංහල ශාසන සම්ප්‍රදාය සියම තුළ ස්ථාපිත වූයේ කෙසේද යන්න තහවුරු වෙයි.

සිංහල සංඝරාජ හිමියන් කොතරම් ජනප්‍රිය වී සිටියේද යත් සුඛෝදයේ 'ලිදය්ය' රජතුමාගේ ක්‍රියාවලියෙන් තහවුරු වෙයි. රාජදූත පිරිසක් යවා උන්වහන්සේ සුඛෝදයට වැඩමවාගත් 'ලිදය්ය' රජතුමා උන්වහන්සේට අවශ්‍ය කරන සියලුම ආකාරයේ පහසුකම් සැපයීය. උන්වහන්සේ වෙතින් ධර්මශ්‍රවණය කළ රජතුමා උන්වහන්සේ වෙත ඒ මොහොතේ ම පැවිදි වීය. රජුගෙන් තොර වූ රාජ්‍යය පරසතුරන්ගේ උවදුරුවලට ලක් වූ විට ඇමති ගණයා හා සාමාන්‍ය ජනයා රජුගෙන් නැවතත් රාජ්‍යය භාර ගන්නා ලෙස ඇයද සිටියහ. නමුත් රජු එයට කැමති වූයේ නැත. මහාසාමි හිමියෝ සිවුරු හැර රාජ්‍ය භාර ගන්නා ලෙස රජුට දැන්වූ හෙයින් රජු රාජ්‍යය භාරගෙන රාජ්‍යය සතුරන්ගෙන් ආරක්ෂා කළේය. මෙම තොරතුරු ඇතුළත් කොට ලියන ලද විශාල සෙල්ලිපියක් සුඛෝදය නගරයේ තිබේ.[38] මේ තොරතුරු ඇතුළත් කරමින් සංඝරාජ හිමියන් විසින් පාළියෙන් රචිත ශිලා ලේඛනයක් ද එහි තිබේ.[39] එම ලිපියෙන් උන්වහන්සේ ලිදෙය්‍ය රජුගේ පැවිද්ද, පැවිද්දට පසුව රට තුළ සිදු වූ සිදුවීම්, සංඝරාජ හිමියන්ගේ අවවාද අනුශාසනා මත නැවත රජු පැවිදිවීම වැනි කරුණු ඇතුළත්



කර තිබේ. සියම් වංසකථාවල මේ සංඝරාජ හිමියන් 'මහාසාමී සංඝරාජ, උදුම්බර මහාසාමී, මේධංකර ථෙර, අනුමති' යන නම්වලින් හඳුන්වා තිබේ.[40] පරණවිතාන මහතා විස්තර කරන ආකාරයට මෙනමින් හඳුන්වන්නට ඇත්තේ දිඹුලාගල පරම්පරාවෙන් පැවත එන ආරඤ්ඤවාසී සඟරාජ හිමිනමක් විය හැකිය. මෙනමින් හඳුන්වන්නට ඇත්තේ දෙවනගල වනරතන සඟරාජ හිමියන් වන්නට ඇතැයි **ජිනකාලමාලියේ** එන විස්තරයකට අනුව ද කල්පනා කළ හැකිය.[41] මේ පිළිබඳව හමුවන සාක්ෂි පරස්පරතාවයකින් යුක්ත වන හෙයින් නිශ්චිත වශයෙන්ම එනමින් හැඳින් වූයේ කවර භික්ෂුවක් පිළිබඳව ද යන්න ගැටලුවක්ව පවතී.

මීට අමතරව සියම් රජ ගෙදරට නැකම් කියන භික්ෂුවක් ලිදෙය්‍ය රජුගේ රාජ්‍ය අවධියේදී මෙරටට පැමිණි බව සඳහන් වෙයි. ඇතැම් විට එම භික්ෂුව තත් අවධියේ මෙරට වැඩ සිටි සඟරජ වූ වනරතන නාහිමියන් පිළිබඳ විස්තර ලිදෙය්‍ය රජුට දන්වන්නට ඇත. ඉහත නම්වලින් හැඳින් වූ උන්වහන්සේ ලිදෙය්‍ය රජුගේ ආරාධනාවෙන් එහි වැඩම කොට සිංහල සඟ සසුනේ පිළිවෙත් එරට ස්ථාපිත කිරීම සඳහා කටයුතු කරන්නට ඇතැයි යන්න ද මෙයින් කල්පනා කළ හැකිය. මෙම තොරතුරුවලට අනුව ගම්පොළ අවධියේදී තායිලන්තයත් ශ්‍රී ලංකාවත් අතර සංස්කෘතික සබඳතා හොඳින් පැවති බව තහවුරු වෙයි.

ගම්පොළ යුගයේ අවසාන කාලපරිච්ඡේදයෙන් පසුව ශ්‍රී ලංකාවත් තායිලන්තයත් නිරතුරුව ම සංස්කෘතික සබඳතා පවත්වා තිබේ. ධම්මකිත්ති නම් සියම් භික්ෂු නමක් ශ්‍රී ලංකාවට පැමිණ ගම්පොළ සීලවංශ ධම්මකිත්ති සංඝරාජ මාහිමියන්ගෙන් මහණ උපසම්පදාව ලැබ අයෝධ්‍යා නගරයට ගොස් එහි ලංකාරාමයේ වාසය කරමින් **සද්ධම්ම සංග්‍රහ** නම් පාළි ග්‍රන්ථය ලියූ බව සඳහන්ය.[42] මින් පසුව සියමත් ශ්‍රී ලංකාවත් අතර සිදුවන සබඳතා සංඝයා වහන්සේලාගේ දූත ගමන්වලින් සැදුම්ලත් බව පෙනේ. බොහෝ විට මෙම දූත ගමන් උපසම්පදා හුවමාරු කර ගැනීම් හා සම්බන්ධ වෙයි. මේ අවධියේ මහා ධම්මගම්භීර නම් තෙරවරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් භික්ෂු පිරිසක් උතුරු සියමේ 'වියං මායි' නගරයෙන් පිටත්ව රාමඤ්ඤ දේශයේ මුත්තිම නගරයෙන් නැව් නැග ක්‍රි. ව. 1424දී කැලණියට පැමිණි

බව **ජිනකාලමාලියේ** සඳහන් වේ.[43] එවකට මෙරට සංඝරාජයන් වහන්සේ වූයේ ජයවර්ධනපුර 'වනරතන' මාහිමියන් වහන්සේ ය.[44] 'ධම්මගම්භීර' හිමියෝ එවකට 'චියං මායි' නගරයේ සිංහල නිකායේ වත්පිළිවෙත් කෙරෙහි කළකිරී සිටි හෙයින් අලුතින් සිංහල මහණ උපසම්පදාව ලබාදෙන ලෙස සංඝරාජ හිමියන්ගෙන් ඉල්ලූහ. ඒ කරුණු විමසූ සංඝරාජ හිමියෝ එම තෙරුන් ප්‍රධාන වැඩමෙව් භික්ෂූන් වනවාසී සම්ප්‍රදායට අනුව පැවිදි කරවා එදින ම උපසම්පදාව ලබාදුන්හ.[45]

එසේ මහණ උපසම්පදාව ලැබූ ධම්මගම්භීර හිමි ඇතුළු සියමෙන් වැඩමෙව් තෙරවරු 'චියංමායි' නගරයට ගොස් සියම් රජුට ලංකා ශාසනික භික්ෂූන්ගේ (මේ වන විට සියමේ සිටි) වත් පිළිවෙත් හා සීලය වැරදි බව අවබෝධ කරවූහ. උන්වහන්සේ විසින් අලුතින් ආරම්භ කරන ලද ලංකා වනවාසී නිකාය 'චියාංමායි' හා ඊට ආසන්න ප්‍රදේශවල ඉතා සීඝ්‍රයෙන් ජනප්‍රිය විය. වනරතන මාහිමියන් සිහිවීම පිණිස ධම්මගම්භීර හිමියන් ඇතුළු භික්ෂු පිරිස වාසය කළ විහාරය 'රත්නවනාරාමය' නමින් හඳුන්වන්නට යෙදුණි.[46] එහි එන සඳහනට අනුව මහාධම්මගම්භීර, මහාමේධංකර, මහාඤාණමංගල, මහාසීලවංස, මහාසාරිපුත්ත, මහාරතනාකාර, මහාබුද්ධසාගර ආදි තෙරවරු උපසම්පදාව සඳහා මෙහි පැමිණියහ. උන්වහන්සේලා වනරතන මාහිමි වෙත එළඹ මෙරට ථේරවාද සම්ප්‍රදාය මැනවින් ඉගෙන ගනිමින් උපසම්පදාව ලබාගත්හ. එය බු. ව. එක්දහස් නවසිය සැට අටවෙනි වර්ෂයෙහි කැලණිය උදකුක්ඛේප සීමා මාලකයේදී සිදු වූ බව සඳහන් කරයි.[47] මෙම භික්ෂූන් වහන්සේලා සිංහල සංඝ ශාසනය සියම තුළ ව්‍යාප්ත කළ ආකාරය පිළිබඳ දිගු විස්තරයක් **ජිනකාලමාලියේ** ඇතුළත් වෙයි.[48] උපසම්පදා විනය කර්මය රජුගේ අනුග්‍රහයෙන් 'කල්‍යාණි නදියේ යාපාපට්ටනයේදී' පැවැත්වුණු බව එහි සඳහන් වෙයි. කැලණියේ සිදු වූ ආකාරයෙන් ම රාජ්‍ය අනුග්‍රහය සහිතව සියමේ බොහෝ ප්‍රදේශවල දහස් ගණනින් සිංහල ක්‍රමයට උපසම්පන්න කරමින් සිංහල සංඝ ශාසනය එරට ස්ථාපිත කිරීමට කටයුතු කළ අයුරු තත් මූලාශ්‍රයෙන් පැහැදිලි වෙයි. මෙම දූත ගමන පිළිබඳව ශ්‍රී ලාංකේය මූලාශ්‍රවල කිසිවක් සඳහන් නොවීම විශාල අඩුපාඩුවක් ලෙසින් සැලකිය හැකිය. මෙම විස්තර මෙරට මූලාශ්‍රවල ද සඳහන්



වූයේ නම් මේවායේ සත්‍ය අසත්‍ය බව කවරේද යන්න අධ්‍යයනය කළ හැකිව තිබේ.

මෙම උපසම්පදා විනය කර්මයෙන් පසුව එරටදී කෙරෙන උපසම්පදා විනය කර්මවලදී ආචාර්ය - උපාධ්‍යාය වශයෙන් කටයුතු කිරීම සඳහා 'මහා වික්කමබාහු හා මහා උත්තමපඤ්ඤ' නම් සිංහල තෙරවරුන් දෙදෙනෙක් වඩමවාගෙන ගිය බවද සඳහන් වෙයි.[49] මෙම දූත ගමනට සහභාගි වූ භික්ෂූන් වහන්සේලා ශ්‍රී මහා බෝධියෙන් රැගෙන ගිය බෝධි අංකුරයක් තායිලන්තයේ 'තිලකරාජ' රජු විසින් 'නිබ්බීස' පුරයෙහි (චියෙං මායි) 'වට් බෝධාරාම' මහාවිහාර භූමියෙහි රෝපණය කර තිබේ.[50] බෝධි රෝපණය සේම එයින් පසුව විශාල උපසම්පදා පූජෝත්සවයක් පැවැත් වූ බවට තොරතුරු හමු වේ. මෙම ඓතිහාසික ආගමික දූත ගමන අග්නිදිග ආසියාවේ රටවල, විශේෂයෙන් තායිලන්තය හා ලාඕසය යන රාජ්‍යයන්හි දීර්ඝකාලීන ආගමික බලපෑමක් ඇති කිරීම සඳහා හේතු වූ බව එම රාජ්‍යයන්හි ඉතිහාසය පරීක්ෂා කිරීමෙන් පැහැදිලි වෙයි.[51] ලක්දිවත් සියමත් අතර වූ සංස්කෘතික හුවමාරුව ශ්‍රී මහා බෝධිය හා වැඩි වශයෙන් බැඳී පවතී. මෙරටින් රැගෙන ගිය බෝධි අංකුර රෝපණය කළ විහාර ස්ථාන ගණනාවක් සියම් රටේ තිබේ. සිහලාරාමය, නකොම්පතොම්, මහා ධාතු විහාරය, ශ්‍රී මහා ධාතු විහාරය, සුබෝශ විහාරය, සාම්ප්‍රාධා විහාරය, මහාබෝධාරාමය ඉන් සමහරකි.[52] මෙයින් ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද සියම කොතරම් ග්‍රහණය කරගෙන ඇති ද යන්න අවබෝධ කරගත හැකිය.

මෙයට පසුව ක්‍රි. ව. 1498 වැනි කාලපරිච්ඡේදයක සියම් භික්ෂු පිරිසක් මෙරටට වැඩිය බවට තොරතුරු හමුවේ. ඉහත වර්ෂය සඳහන් වන සෙල්ලිපියකට අනුව 'මහාකාශ්‍යප' ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකාවට පැමිණි උතුරු සියමේ භික්ෂු පිරිසක් සිංහල පැවිදි උපසම්පදාව ලැබ පෙරළා එහි ගොස් ලම්පුන් නගරයේ ලංකා ශාසන සම්ප්‍රදාය පිහිටු වූ බව සඳහන් වෙයි.[53] මෙපමණ කාල පරිච්ඡේදයක් සම්බන්ධයෙන් අපට දක්නට ලැබුණේ ශ්‍රී ලංකාවෙන් සියමට ගොස් මෙරට මහණ උපසම්පදාව එහි ප්‍රතිෂ්ඨාපණය කිරීම හෝ මෙරට විවිධ චාරිත්‍ර ධර්ම එරට ව්‍යාප්ත වීම කරලීමයි. නමුත් මේ පිළිවෙතෙහි වෙනස්වීමක් ක්‍රි. ව. දහඅට වන සියවසේදී සිදු වන බව

පෙනේ. දහසය වන සියවසේ මැද භාගය වන විට මෙරට උපසම්පදාව හා ලංකා ශාසන සම්ප්‍රදාය අභාවයට යමින් තිබුණි. නමුත් සියමේ මේ වන විට ශ්‍රී ලංකාවෙන් රැගෙන ගිය මහණ උපසම්පදාව එරට පාලකයන්ගේ අනුග්‍රහය යටතේ මැනවින් වර්ධනය වී තිබූ ආකාරයක් දැකගත හැකිය.[54] එසේ ස්ථාවරව පැවති සියම් උපසම්පදාව මෙරට භික්ෂූන් වෙත ලබා ගැනීම සඳහා ක්‍රි. ව. දහ අටවන සියවසේ මෙරට භික්ෂු ප්‍රජාව හා පාලක ප්‍රජාව ප්‍රයත්න දැරූ බවට තොරතුරු හමු වේ.

මහනුවර යුගයේ මෙරට බුදු සසුන නගා සිටුවීමේ ප්‍රමුඛයා වූයේ වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේය. සරණංකර මාහිමියන්ගේ මහත් කැපවීම හා කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මනා අනුග්‍රහය මත සියමේ අයෝධ්‍යා නුවරින් උපාලි මහ ස්ථවිර ප්‍රමුඛ සියම් භික්ෂු සංඝයා මෙහි පැමිණ යළි මෙරට මහණ උපසම්පදාව ප්‍රතිෂ්ඨාපනය කළහ.[55] සිංහල භික්ෂූන්ට උපසම්පදා විනය කර්මය කරන්නේ කෙසේ දැයි පෙන්වාදීම සඳහා සියම් දේශයෙන් වැඩිය සාමණේරයන් වහන්සේ කෙනෙක් ප්‍රථමයෙන් උපසම්පදා කළ බව සඳහන් වෙයි.[56] මෙම උපසම්පදා විනය කර්මය සිදු වූ ආකාරය හා එහි පැවති චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ දිගු විස්තරයක් **සියම් ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා** නම් කෘතියේ සඳහන් කර තිබේ.[57] උපසම්පදා විනය කර්මය කිරීමට අවශ්‍ය කරන සියලු පහසුකම් කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් සපයන ලදී. එතුමා විනය කර්මයට අවශ්‍ය පොහොය ගෙවල් පවා නිර්මාණය කළේය. සියමෙන් ලැබුණු මේ සංස්කෘතික දායාදය ශ්‍රී ලාංකේය ශාසනික ඉතිහාසයේ ඉදිරි පැවැත්මට මහඟු දායාදයක් විය. මෙම උපසම්පදා සීලය ශ්‍රී ලංකාවට ලැබීමෙන් පසුව මෙරට සියම් උපසම්පදාව ස්ථාපිත වූ අතර එයින් සියම් නිකාය නමින් නිකාය සම්ප්‍රදායක් ද බිහිවුණි. උපසම්පදා හා මහණ කිරීමේ චාරිත්‍ර වාරිත්‍ර සියම් රටෙන් ලැබුණු පිළිවෙලක් ලෙස සලකා ඔවුන් අද තෙක් එම සම්ප්‍රදාය පවත්වාගෙන එයි. මේ ආකාරයෙන් මෙරට ස්ථාපිත කළ මහණ උපසම්පදාව පහළොස් වන සියවසේ පටන් මෙරටින් රැගෙන ගොස් එරට ස්ථාපිත කර තිබූ සිංහල මහණ උපසම්දාව ම විය හැකි බව ඉතිහාසය සුපරීක්ෂාකාරීව බැලීමෙන් තහවුරු වෙයි. මේ පිළිබඳව අදහස් දක්වන ඇතැම් විචාරකයන් පෙන්වා දෙනුයේ මෙම සියම්



උපසම්පදාවෙන් සම්පූර්ණයෙන් ම සියම් දේශයේ සංස්කෘතික උරුම යි මෙරටට ලැබුණා නොව, මෙරට සිටි භික්ෂූන් වහන්සේලාට තමන් පෙර කාලයේ අනුගමනය කළ සිරිත් විරිත් හා ක්‍රමවේදයන් නැවත සිහි ගැන්වීමක් පමණක් සිදු කළ බවය.

මෙරට මූලාශ්‍රවල එක් සියම් දූත ගමණක් පිළිබඳව වාර්තා වුව ද (මයිකල් රයිට්) විසින් සොයාගෙන ඇති තානාපති වාර්තාවන්ට අනුව ක්‍රි. ව. 1755දී දෙවන සියම් දූත ගමණක් ශ්‍රී ලංකාවට පැමිණි බව වාර්තා වෙයි. සියම් රජු පෙර දූත කාර්යය සඵල වූ හෙයින් තමන්ට වැඩි වැඩියෙන් පින් අයිති වීමටත් පෙර දී පැමිණි භික්ෂූන්ට නැවත සියමට පැමිණීම සඳහාත් මේ දූත ගමන සිදු කළ බව වාර්තා වෙයි.[58] මෙම දූත ගමණට හැටකට වැඩි පිරිසක් සහභාගි වූ බවත් ඔවුන් අතින් මෙරට බොහෝ භික්ෂූන් මහණ උපසම්පදාව ලද බවත් සඳහන් වෙයි.[59] මෙම දූත ගමන්වලදී සිදු වූ වැදගත්ම සංස්කෘතික දායාදයක් වූයේ මෙරට නොතිබූ ග්‍රන්ථ රැසක් සියම් දේශයෙන් මෙරටට ලැබීමයි. මෙරටින් කරන ලද ඉල්ලීමට අනුව 'බොරොම් කොට්' මහරජු **සුමංගලවිලාසිනී, අට්ඨකථා සුත්තපිටක, මොග්ගල්ලාන ප්‍රකරණ, කච්චායනපකරණ, පරමත්ථදීපනී, විනයවිනිච්ඡය** ආදි වශයෙන් ග්‍රන්ථ 97ක් මෙරටට පරිත්‍යාග කර තිබේ.[60] මෙය ශ්‍රී ලංකාවට සියමෙන් ලැබුණු මහත් වූ සංස්කෘතික දායාදයකි. 'බොරොම් කොට්' සියම් මහරජුගේ අදහසට අනුව තෙවන වරටත් සියම් භික්ෂු පිරිසක් මෙරටට ක්‍රි. ව. 1764දී පැමිණි බව මූලාශ්‍රවලින් සනාථ වෙයි.[61] එම භික්ෂු පිරිස විසින් ද කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අනුග්‍රහය ඇතිව තත් වර්ෂයේදී උපසම්පදා උත්සවයක් පවත්වා තිබේ. මෙම දූත ගමන් ශ්‍රී ලංකාවේ භික්ෂු ශාසනය සුරක්ෂිත කිරීම සඳහා මහත්සේ උදව් වූ බව කිව යුතුය.

## නිගමනය

ඉතිහාසය සුපරීක්ෂාකාරීව අධ්‍යයන කිරීමේදී පැමිණිය හැකි නිගමනය වනුයේ කලින් කලට දෙරට සිය සංස්කෘතික දායාදයන් හුවමාරු කරගන්නට යෙදුණු බවය. මූලාශ්‍ර තොරතුරුවලට අනුව දෙරටේ සබඳතාවන්හි ඉතිහාසය අනුරාධපුර යුගයේ මධ්‍ය අවධිය තෙක් ඈතට ගමන් කරන බව පෙනේ. අනුරාධපුර මධ්‍ය අවධියේදී මෙරට

ජනප්‍රියව පැවති කලා නිර්මාණ හා ශ්‍රී මහා බෝධිය, සිරිපතුල් වන්දනය වැනි ඇදහිලි හා චාරිත්‍ර වාරිත්‍ර සියමට මෙරටින් ලැබුණි. පොළොන්නරු යුගයෙන් පසුව එම චාරිත්‍ර ධර්මයන්ට අමතරව දෙරටේ වාසය කළ ථෙරවාදී භික්ෂූන්ගේ මහණ උපසම්පදා චාරිත්‍ර ධර්ම හුවමාරු කර ගැනීමේ ක්‍රමවේදයක් ද ක්‍රියාත්මක වුණි. එයින් මේ රාජ්‍යයන් දෙකෙහිම සඟ සසුන අර්බුදවලින් තොරව ඉදිරියට පවත්වාගෙන යාම සඳහා බෙහෙවින් ඉවහල් විය. දෙරට අතර ගොඩ නැඟුණු මෙම ඓතිහාසික සබඳතා දෙරටේ සංස්කෘතික අභිවර්ධනය සඳහා බෙහෙවින් ඉවහල් වී ඇති බව දෙරටේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී මැනවින් පසක් වෙයි. මේ ආකාරයෙන් දෙරටේ ම සංස්කෘතික සබඳතා සීඝ්‍රයෙන් ජනප්‍රිය වීම සඳහා බලපෑ කරුණ වනුයේ දෙරට ම ථෙරවාදී සම්ප්‍රදාය ගරු කළ නිසා යැයි කල්පනා කළ හැකිය.

## ආන්තික සටහන්

[1] රෙජිනල්ඩ් ලි මේ, **අග්නිදිග ආසියාවේ සංස්කෘතිය**, කොළඹ: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1971, පිටුව 41.

[2] **එම**,

[3] **ජිනකාලමාලි**, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ලංකා බෞද්ධ මණ්ඩලය විසින් ප්‍රකාශිතය, 1956, පිටුව 88.

[4] මංගල ඉලංගසිංහ, **මධ්‍යකාලීන ලංකාවේ ආගම**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2005, පිටුව 234.

[5] රෙජිනල්ඩ් ලි මේ, **එම**, 1971, පිටුව 41.

[6] **එම**, පිටු 41 - 42.

[7] ''යො සබ්බලොක මහිතො කරුණාධිවාසො - මොක්ඛාකරො රවිකුලම්බර පුණ්ණ චන්දො'' **තේලකටාහ ගාථා කාව්‍යය හා තේලකටාහ ගාථා**, සංස්. තෙලුම්පත්ගම සරණංකර හිමි, බම්බලපිටිය: ඤාණාදර්ශය ප්‍රකාශකයෝ, 1915, පිටුව 1.

[8] රෙජිනල්ඩ් ලි මේ, **එම**, 1971, පිටුව 38.



[9] **එම**,

[10] සිරිනිමල් ලක්දුසිංහ, ''වාස්තු විද්‍යාව'' **ශ්‍රී ලාංකේය ඉතිහාසය වෙළුම II**, සංස්. ඩබ්ලිව්. එම්. කේ. විජේතුංග, 2012, පිටු 481 - 482.

[11] **ජිනකාලමාලි**, 1956, පිටුව 178.

[12] **එම**, පිටුව 179.

[13] **එම**, පිටු 180 - 181.

[14] **ඌනපූරණසහිතො මහාවංසො**, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පරි. 72. ගාථා 103 - 105.

[15] **එම**, පිටු 450 - 451. මහාපරාක්‍රමබාහු රජු හා සුගලා දේවිය අතර රාජත්වයේ සංකේතය වූ දළදා වහන්සේ ලබා ගැනීම සඳහා කරන ලද අරගලය මෙයට කදිම නිදසුනයි.

[16] **ජිනකාලමාලි**, 1956, පිටු 179 - 180 - 181.

[17] රෙජිනල්ඩ් ලි මේ, **එම**, 1971, පිටුව 42.

[18] **එම**,

[19] කුඹුරුගමුවේ වජිර හිමි, **දළදා ඉතිහාසය සහ සංස්කෘතිය**, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ, 2008, පිටු 245 - 248.

[20] **මහාවංශය**, (දෙවන කොටස) සංස්. හික්කඩුවේ සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬිතුමා, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2000, පරි. 83. ගාථා. 36 - 37 - 38., **පූජාවලිය**, සංස්. කිරිඇල්ලේ ඤාණවිමල හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1997, පිටුව 790.

[21] **මහාවංසය**, (දෙවන කොටස) 2000, පරි. 84. ගාථා. 11 - 12., **පූජාවලිය**, 1997, පිටුව 791.

[22] **ජිනකාලමාලි**, 1956, පිටුව 183.

[23] **ජිනකාලමාලි**, 1956, පිටු 183 - 184.

[24] George Coedes, **The Indianized States of Southeeast Asia**, Honolulu, 1968, p. 356.

[25] ඉලංගසිංහ, **එම**, 2005, පිටුව 235.

[26] **එම,**

[27] රෙජිනල්ඩ් ලි මෙ, **එම,** 1971, පිටුව 136.

[28] **එම,** පිටුව 131.

[29] **එම,** පිටු 137 139. සිංහල සංස්කෘතික දායාද සියමේ සුඛෝතායි රාජ්‍යයට හා අනෙකුත් රාජ්‍යයන්ට ලැබුණු ආකාරය හා තත් නිර්මාණ කවරේද යන්න දිගු විස්තරයක් මෙහි දී සිදුකර තිබේ.

[30] **එම,** පිටුව 139.

[31] **එම,**

[32] **ජිනකාලමාලී,** 1956, පිටුව 187.

[33] **එම,**

[34] සෙනරත් පරණවිතාන, "ලංකාවේ සිට සියමට වැඩිය සංඝරාජයානෝ" **ලිපි මාලා - 1,** පන්නිපිටියඃ ස්ටැම්ෆර්ඩ් ලේක් (පුද්ගලික) සමාගම, 2009, පිටු 67 - 69.

[35] **ජිනකාලමාලී,** 1956, පිටුව 176.

[36] **එම,**

[37] **එම,**

[38] පරණවිතාන, **එම,** 2009, පිටු 66 - 67. මෙහිදී පරණවිතාන මහතා ලිදෙය්‍ය රජු විසින් පිහිටුවා ඇති සෙල්ලිපියේ පාඨයක් දක්වමින් විවරණයක් සපයා ඇත.

[39] **එම,** පිටු 67 - 68. පරණවිතාන මහතා සිය ලේඛනයේදී සංඝරාජ හිමියන් විසින් ලියූ ලේඛනයේ පෙළ උපුටා දක්වා තිබේ. ඒ පිළිබඳව වැඩි දුරටත් එයින් කියවා කරුණු අවබෝධ කරගත හැකිය.

[40] **ජිනකාලමාලී,** 1956, පිටු 69 - 70 - 79.

[41] **එම,** පිටුව 77.

[42] ගුණපාල මලලසේකර, **ලංකා පාලි සාහිත්‍යය,** කොළඹඃ ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1965, පිටු 333 - 334.

[43] **ජිනකාලමාලී,** 1956, පිටුව 183.

[44] **එම,**

[45] **එම,**



[46] **එම,** පිටුව 184.

[47] **එම,** පිටුව 183.

[48] **එම,** පිටු 184 - 185.

[49] **එම,** පිටුව 195.

[50] ඉලංගසිංහ, **එම,** 2005, පිටුව 242.

[51] **ජිනකාලමාලී,** 1956, පිටු 183 - 184.

[52] පියසිරි ජී. මීගොඩ, **බෞද්ධ ප්‍රබුද්ධ වූ තායිලන්තය,** කොළඹඃ එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2008, පිටුව 93.

[53] ජී. හේමපාල විජයවර්ධන සහ පී. බී. මීගස්කුඹුර, **සියම් - ශ්‍රී ලංකා ආගමික සම්බන්ධතා** (18 වන සියවස), කොළඹඃ ප්‍රදීප ප්‍රකාශකයෝ, 1993, පිටු 67 - 70.

[54] **එම,**

[55] **මහාවංසය,** (ද්විතීය භාගය) 2000, පරි. 100. පිටු. 309 - 311.

[56] විභාවි විජයශ්‍රීවර්ධන, "ලාංකේය නූතන නිකායවාදයන්හි සාකච්ඡා වූ දේශාන්තර සම්ප්‍රදාය ලක්ෂණ" **ප්‍රබුද්ධ - 2,** (ශ්‍රී බුද්ධරක්ඛිත මහානාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය) සංස්. ආණමඩුවේ ධම්මදස්සි හිමි, කොළඹඃ සමයවර්ධන මුද්‍රණාලය, 2000, පිටුව 260.

[57] විජයවර්ධන සහ මීගස්කුඹුර, **එම,** 1993, පිටු 67 - 70.

[58] **එම,**

[59] **එම,** පිටු 83 - 100.

[60] **එම,** පිටු 100 - 101.

[61] **එම,**



16 JUL 2015